Student Journal of Social Work (SJSW)
Volume 05 – Issue 01

**06**

# ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත සිසුන්ගේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සදහා සමාජ වැඩ මැදිහත්කරණය.

# SOCIAL WORK INTERVENTIONS FOR ENHANCING THE EDUCATION OF VISUALLY IMPAIRED STUDENTS IN SRI LANKA

**[*1] H. M. C. D. Amunugama & [2]H. K. Sandya Sirikumara**
School of Social Work, National Institute of Social Development, Seeduwa, Sri Lanka
Corresponding Author Email: chamodyaamunugamahm@gmail.com

**ABSTRACT**

The main objective of this study is to examine how social work interventions contribute to the development of learning methodologies aimed at improving the educational status of students with visual impairments. Both primary and secondary data were utilized for this research. Primary data were collected mainly through questionnaires and structured interviews. A sample of fourteen students aged 13–16 years from Sandagala Special School in the Kurunegala District of the North Western Province of Sri Lanka was selected. In addition, interviews were conducted with six teachers from the same school. Accordingly, purposive sampling under non-probability sampling techniques was employed.

After data collection, the data were analyzed using both quantitative and qualitative analytical approaches within a mixed-methods framework. Based on the findings derived from the data analysis, a series of recommendations and conclusions were presented. Key recommendations include the need to improve technological devices for students with visual impairments, the establishment of suitable subject-specific support groups within the school to enhance educational assistance, the provision of necessary guidance for their vocational development, and the implementation of awareness programmes on effectively integrating new technologies into learning. Findings from the factor analysis indicated that existing educational methods and technologies require further enhancement. The study also revealed that modern technological approaches can significantly promote self-directed learning among students with visual impairments.

**KEYWORDS :** visual impairment, learning methods, innovation, development, educational support

**සංක්ෂේපය**

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අධ්‍යයන අරමුණ වන්නේ දෘශ්‍යාබාධිත සිසුන්ගේ අධ්‍යාපන තත්ත්වය නගා සිටුවීම සඳහා යොදා ගනු ලබන ඉගෙනුම් ක්‍රමවේද සංවර්ධනය කිරීම සඳහා සමාජ වැඩ මැදිහත්කරණය සිදු කුමනාකාරද යන්න අනාවරණය කර ගැනීමයි. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත යන දෙවර්ගයේම දත්ත භාවිත කරන ලදී. ප්‍රාථමික දත්ත ලබාගැනීම සඳහා මූලිකවම ප්‍රශ්නාවලි සහ නියමු සම්මුඛ සාකච්ඡාද භාවිතා කරන ලදී. ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ,කුරුණෑගල දිස්ත්‍රික්කයේ සඳගල විශේෂ විද්‍යාලයේ අවුරුදු 13 – 16 දක්වා ශිෂ්‍යයින් 14 දෙනෙකු තෝරා ගන්නා ලදී. එසේම පාසලේ ගුරුවරුන් 06 දෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා සිදුකරන ලදී. ඒ අනුව සසම්භාවී නියදීම යටතේ අරමුණුගත නියැදිය ඔස්සේ නියැදීම සිදු කරන ලදී. දත්ත ඒකරාශී කිරීමෙන් පසු එම දත්ත විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා මිශ්‍ර ක්‍රමවේදය තුළ ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණය උපයෝගී කරගෙන ඇත. දත්ත විශ්ලේෂණයෙන් අනතුරුව සොයා ගන්නා ලද විවිධ කරුණු පදනම් කොට ගනිමින් යෝජනා සහ නිගමන ඉදිරිපත් කිරීම සිදු කර ඇත. ඒ අනුව වැදගත් යෝජනා කිහිපයක් ලෙස දෘශ්‍යාබාධිත සිසුන් සඳහා තාක්ෂණික උපකරණ දියුණු කළ යුතු බව, ඔවුන්ගේ අධ්‍යාපනික සහය සඳහා ඒ ඒ විෂයන්වලට අදාළ සුදුසු කණ්ඩායම් පාසල තුළ නිර්මාණය කිරීම, වෘත්තීය සංවර්ධනය සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් සිදුකිරීමට කටයුතු කිරීම, නව තාක්ෂණික කටයුතු තුළින් අධ්‍යයන කටයුතු සාර්ථක කර ගැනීම පිළිබඳ අවබෝධය ලබාදීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි කරුණු හඳුනාගත හැකිය. ප්‍රධාන සංරචක විශ්ලේෂණය තුළින් සොයා ගන්නා ලද්දේ පවතින අධ්‍යාපන ක්‍රම තාක්ෂණය තුළින් දියුණු කළ යුතු බවයි. නවීන තාක්ෂණික ක්‍රම හරහා ස්වයං අධ්‍යයන කටයුතු සංවර්ධනය කළ හැකි බව මෙම අධ්‍යයනය තුළින් අනාවරණය විය.

**මුඛ්‍ය පද:** දෘශ්‍යාබාධිත බව, ඉගෙනුම් ක්‍රමවේද, නවීනතාව, සංවර්ධනය, අධ්‍යාපනික සහය

**හැදින්වීම**

ආබාධ සහිත තැනැත්තකු යන්නෙන් සහජයෙන්ම ඇති වූ හෝ එසේ සහජයෙන්ම ඇති නොවුව ද ශාරීරික හෝ මානසික හැකියාවන්හි යම් ඌනතාවක ප්‍රතිඵලයක් ලෙස ජීවිතයේ අවශ්‍යතාවන් මුළු මනින්ම හෝ කොටස් වශයෙන් හෝ තමා විසින් තමා සඳහාම ඉටුකර ගැනීමට නොහැකි වූ යම් තැනැත්තකු අදහස් වේ (විගණකාධිපති දෙපාර්තමේන්තුව, 2015). සාමාන්‍ය පුද්ගලයෙකුට කරගත හැකි කාර්යයක් ඒ ලෙසින්ම කර ගැනීමකට බාධාවක් ඇති පුද්ගලයකු ආබාධිතයෙකි. ඔහුට ශරීරයේ විවිධ අංශවලින් සිදුකළ යුතු කාර්යයන් සිදුකිරීමට නොහැකියාව ඇත. ආබාධිත බව පූර්ණ වශයෙන්, අර්ධ වශයෙන් හෝ ස්වල්ප වශයෙන් ඇතිවීමට හැකිය. ඒ අනුව ආබාධ සහිත පුද්ගලයා මානව විවිධත්වය තුළ යම්කිසි සංකීර්ණ බවක් නිරූපණය කරන සංවේදී පුද්ගලයන් වේ.

ලෝක ජනගහනයෙන් 16% ක් පමණ ආබාධ සහිත පුද්ගලයන් බව වර්තමානයේ පිළිගනු ලබයි (එක්සත් ජාතීන්ගේ ජනගහන දත්ත, 2020). ඒ අනුව ලෝක ජනගහනයෙන් ආබාධ සහිත පුද්ගලයන් අතිවිශාල සංඛ්‍යාවක් සිටින අතර ඒ පිරිස වැඩි වෙමින් පවතී. එය මිලියන පන්සියයක් වශයෙන් ගණන් බලා ඇත්තේ ජනගහන කාණ්ඩ ගෙන කරන ලද සමීක්ෂණවලින් හා පළ පුරුදු පර්යේෂකයන්ගේ නිරීක්ෂණවලින් ලබා ගන්නා ලද ප්‍රතිඵල අනුවය. බොහොමයක් රටවල 1/10ක් අයෙකුට කායික, මානසික හෝ ඉන්ද්‍රියමය ඌනතාවයකින් ආබාධ වී සිටී. ජනගහනය වයස්ගත වීම සහ බෝ නොවන ව්‍යාප්තිය වැඩිවීම හේතුවෙන් ආබාධිත සංඛ්‍යාව වැඩිවෙමින් පවතී.

ආබාධිත පුද්ගලයන් යනු තවදුරටත් කිසිවක් කරගත නොහැකි පුද්ගලයන් කණ්ඩායමක් නොව ඔවුන් විවිධ වෙනස් හැකියාවන්ගෙන් පිරිපුන් පිරිසක් වේ (Dror, 2019). ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් මිලියන 1.7 ක් ආබාධිත පුද්ගලයන් වන අතර එය මුළු ජනගහනයෙන් 8.2% කි. ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 16-65 අතර ආබාධ සහිත පුද්ගලයන්ගේ සංඛ්‍යාව 570,000 කි. 2012 ජනගහන හා නිවාස තොරතුරු අනුව මුළු ආබාධිත පුද්ගලයන් (ශාරීරික හා මානසික දෙවර්ගයේම) 1,617,924ක් සිටිති. මෙම පුද්ගලයන් අතරින් 996,939 ක් දෘශ්‍යාබාධිත පුද්ගලයින්ය. ඒ අනුව මුළු ආබාධිත ජනගහනයෙන් වැඩි ලෙස සිටින්නේ දෘෂ්ටි ආබාධ සහිත පුද්ගලයන්ය. තවද මුළු ජනගහනයෙන් 1000 කට 87 දෙනෙකු කිසියම් හෝ ආබාධයකින් පෙළෙන අතර මුළු ජනගහනයෙන් 1000 කට 54 දෙනෙකු යම්කිසි දෘෂ්ටි ආබාධ තත්ත්වයකින් පසුවේ (Department of Census and Statistics. 2012). ඒ අනුව ආබාධ සහිත පුද්ගලයන් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් ලෙස සලකයි. ආබාධ සහිත තැනැත්තකු යන්නෙන් සහජයෙන්ම ඇති වූ හෝ එසේ නොවූ ශාරීරික හෝ මානසික හැකියාවන්හි යම් ඌනතාවයක ප්‍රතිඵලයක් වශයෙන් ජීවිතයේ අවශ්‍යතාවන් මුළුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ තමා සඳහාම ඉටුකර ගැනීමට නොහැකි යම් තැනැත්තකු අදහස් වේ (Protection of the Rights of persons with disabilities Act, 1996).

ආබාධිතභාවය අනුව ආබාධිත පුද්ගලයින් ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වෙන්කර දැක්විය හැකිය. එහිදී ඇස් පෙනීමේ අපහසුතා ඇති පුද්ගලයින්,කතා කිරීමේ සහ ඇසීමේ අපහසුතා ඇති පුද්ගලයින්,අංග චලන අපහසුතා ඇති පුද්ගලයින්,මානසික ඌනතාවය ඇති පුද්ගලයින්,අමුතු හැසිරීම් ඇති පුද්ගලයින්, අපස්මාර රෝගීන් ( ආබාධ සහිත දරුවන් සඳහා විශේෂ අධ්‍යාපනය. 2005) යනාදී වශයෙනි.

ආබාධ සහිත පුද්ගලයා යනු ප්‍රජාවේ වෙසෙන වටහා ගැනීමේ ඌණතාවයන් ඇත්තා වූ, ඇසීමේ අපහසුතා ඇත්තා වූ ,කතා කළ නොහැක්කා වූ, අංග චලන අපහසුතා ඇත්තා වූ, ඇස් පෙනීමේ අපහසුතා ඇත්තා වූ, පුද්ගලයෝ සිටිති. එසේම අපස්මාරය සැදෙන්නා වූ, සම වයස් අනෙක් පුද්ගලයන් මෙන් වැඩිකර ගැනීමට නොහැක්කා වූ පුද්ගලයන්ද සිටිති. එබඳු පුද්ගලයන් ආබාධිතතාවයන් ඇති පුද්ගලයන් වශයෙන් හඳුන්වති" (World Health Organization, 2008).

මේ අනුව වත්මන් ශ්‍රී ලාංකීය සමාජය තුළ අවාසිදායක තත්ත්වයේ පසුවන එක් පුද්ගල කණ්ඩායමක් ලෙස ආබාධිත පුද්ගලයන් හඳුනාගත හැකි වේ. මෙකී ආබාධිත පුද්ගලයන් අතරින් දෘශ්‍යාබාධිත පුද්ගලයන් ප්‍රධාන වේ. දෘෂ්‍යාබාධිතයින් ලෙස දක්වන්නේ පෙනීමේ දුර්වලතා තිබෙන පුද්ගලයන්ය. ඇසට සාමාන්‍ය පරිදි වස්තූන් පැහැදිලිව නොපෙනෙන දෘෂ්‍ය තීව්‍රතාවය අඩුවීම නිසා පෙනීමේ දුර්වලතා ඇති විය හැක. එසේම ඇස් වල පෙනීම සම්පූර්ණයෙන් නැති වී යාමද සිදුවේ. මේ ආකාරයෙන් දෘෂ්‍යාබාධිතයින් විවිධ ලෙස සිටී. පුද්ගලයෙකුගේ ඉන්ද්‍රයන්ගෙන් සංවේදීම ඉන්ද්‍රිය වන්නේ ඇසයි. එබැවින් පෙනීමේ දුර්වලතා ඇතිවූ විට එය මානසික, සමාජීය හා චිත්තවේගීය වශයෙන් පුද්ගලයාට බලපෑම් ඇති කරනු ලැබේ. දෘශ්‍යාබාධිතභාවය අර්ධ වශයෙන් හා පූර්ණ වශයෙන් ලෙස වර්ගීකරණය කළ හැකිය. මෙලෙස දෘශ්‍යාබාධිත තත්ත්වයක් ඇති වීමට හේතු ලෙස, වර්තන දෝෂ,ඇසේ සුද ඉවත් කිරීම, දියවැඩියාව, ග්ලුකෝමාව වයසට සම්බන්ධ අක්ෂි පරිහානිය හේතු වේ (World Health Organization, 2008).

ගෝලීය වශයෙන් ගත් කළ අවම වශයෙන් බිලියන 2.2ක් ජනතාවකට ආසන්න හෝ දුර පෙනීමේ දුර්වලතා පවතී. මෙයින් අවම වශයෙන් බිලියන 01 කට හෝ පෙනීමේ දුර්වලතා වළක්වා ගත නොහැක.ගෝලීය ලෙස පෙනීමේ දුර්වලතා සහ අන්ධභාවයට ප්‍රධානතම හේතුව වන්නේ වර්තන දෝෂ සහ ඇසේ සුද ඉවත් වීමයි. වර්තන දෝෂ හේතුවෙන් දුරස්ථ පෙනීමේ දුර්වලතා ඇති පුද්ගලයින් 30% ක්ද, ඇසේ සුද හේතුවෙන් 17% කගේද පෙනීමේ දුර්වලතා පවතී. මෙය ගෝලීය මූල්‍ය බර ඇති කිරීමට හේතු වේ (ශ්‍රී ලංකාවේ දෘශ්‍යාභාධිතයෝ , 2003).

දෘශ්‍යාබාදිතබව ජීවිත කාලය පුරාවටම බරපතල ප්‍රතිවිපාක ඇති කරයි.ගුණාත්මක අක්ෂි සත්කාර මගින් මෙය යම්තාක් හෝ අවම කරගත හැකිවේ.ගෝලීය වශයෙන් සලකා බලන කල ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත බව ඉහළ යමින් පවතින බව කිව යුතුය. එනම් ශ්‍රී ලංකාව තුළ 1.1%ක් දෘශ්‍යාබාධිත තත්ත්වයෙන් පෙළේ. මෙය ඉන්දියාවේ 0.47% , නේපාලයේ 0.37% ක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව දෘශ්‍යාබාධිත බවින් ප්‍රමුඛ වී ඇත. එය විශාල

ගැටලුවකි. ශ්‍රී ලංකාවේ දෘෂ්‍යාබාධිත පුද්ගලයින් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වන 8% ක ප්‍රමාණයක් දෘශ්‍යාබාධිත භාවයෙන් පෙළේ (Department of Census and Statistics, 2012).

දෘෂ්‍යාබාධිත පුද්ගලයින් වර්ග කිහිපයකි එනම් පූර්ණ අන්ධ,එක් ඇසක් පමණක් අන්ධ, දුර හෝ ළඟ පෙනීම නොමැති, ආලෝකය පමණක් පෙනෙන, තරමක් පෙනෙන, රාත්‍රී කාලයේ පෙනීම නැති, වර්ණ හඳුනාගත නොහැකි (ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිතයෝ, 2003). මෙයින් පූර්ණ අන්ධ පුද්ගලයින් විශේෂ වේ.ඔවුන්ගෙන් බොහෝදෙනකු උපතින් අන්ධ පුද්ගලයන්ය. මෙම අන්ධ පුද්ගලයින් සඳහා අධ්‍යාපනය ලැබීමට විශේෂ අධ්‍යාපන ක්‍රමවේදයන් පැවතිය යුතුය. දෘශ්‍යාබාධිතයින් බ්‍රේල් ක්‍රමය හරහා අධ්‍යාපනය ලබයි.බ්‍රේල් අධ්‍යාපනය සියලුම පාසල්වල දක්නට නොලැබේ.විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සිටින පාසල්වල බ්‍රේල් අධ්‍යාපනය පවතී. මෙහිදී ඔවුන් වෙනුවෙන් මුලින්ම ආරම්භ කළ පාසල වූයේ රත්මලාන අන්ධ විද්‍යාලයයි.පසු කාලය වන විට අන්ධ පාසල් කිහිපයක් පිහිටුවා ඇත.එමෙන්ම සාමාන්‍ය පාසල් තුළද මෙම අධ්‍යාපනයන් දැකගත හැකි වේ.මෙවැනි අධ්‍යාපන ක්‍රමවේදයක් තිබීම ඔවුන්ගේ සාක්ෂරතාවය වර්ධනය කිරීමට ඉවහල් වේ. නමුත් දෘශ්‍යාබාධිත සිසුන් සඳහා අධ්‍යාපන ක්‍රමවේදයන් සකස් කළ යුතු අතර එය ඔවුන්ට පහසු විය යුතුය. එබැවින් ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත සිසුන්ගේ අධ්‍යාපන ක්‍රමවේදයන්හි බලපෑම පිළිබඳව අධ්‍යයනය කළ යුතුය.

අධ්‍යාපනය සියලුම දරුවන්ගේ මූලික මානව අයිතිවාසිකමක් වන බව 1948 මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය මගින්, 1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය මගින් හා තිරසර සංවර්ධන ඉලක්ක 04 යටතේ ද තහවුරු කර ඇත. ඒ අනුව ශාරීරික හෝ මානසික ආබාධිත දරුවන්ට ද අනෙකුත් දරුවන් හා සමානවම අධ්‍යාපනය ලබා දීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මෙන්ම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ද මැදිහත් වී ඇත (විගණකාධිපති දෙපාර්තමේන්තුව, 2015).

දෘශ්‍යාබාධිත දරුවන් සිටින බොහෝ පවුල්වල දැකිය හැකි ලක්ෂණ වන්නේ දුර්වල ආර්ථික තත්ත්වය, අනවබෝධය, නිසි අධ්‍යාපනය නොලැබීම යනාදිය ප්‍රධාන වේ. එම නිසා ඒ පිළිබඳව අවබෝධයක් ලබාදිය යුතුවේ. අධ්‍යාපනය ලබා දීමේදී ඔවුන්ට උසස් අධ්‍යාපනයට පවා යොමු විය හැකිවේ.එහිදී උපාධිධාරියෙක් බවට පත්වීමට ද අවස්ථාව ඇත. ඒ සඳහා ඔවුන්ට ප්‍රාථමික අධ්‍යාපනයේ සිට තෘතීක අධ්‍යාපනය දක්වා අධ්‍යාපන ක්‍රමවේදය තුළ විශාල අභියෝග ප්‍රමාණයකට මුහුණ දීමට සිදුවේ. එම අභියෝග මගහැරවීම සඳහා සමාජ වැඩකරුවෙකු ලෙසට විශාල කාර්යභාරයක් සිදුකිරීමට හැකියාව පවතී. ඒ සඳහා දෘශ්‍යාබාධිත සිසුන්ගේ සාක්ෂරතාවය සහ පාසල් පද්ධතිය තුළ පවතින ඉගෙනුම් ක්‍රමවේදයන් පිළිබඳව ගැඹුරින් පර්යේෂණාත්මකව කතිතාවතක් ගොඩනැගීම අත්‍යවශ්‍ය වේ.

**අධ්‍යයනයේ වැදගත්කම**

මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත ළමුන් වන දෘශ්‍යාබාධිත පාසල් ළමුන් සඳහා සමාජ වැඩ මැදිහත්වීම්වල සඵලතාවය විමර්ශනය කරයි. මෙහිදී විශේෂයෙන් ඔවුන්ගේ අධ්‍යාපන ක්‍රමවේදයන් පිළිබඳව විමසීමකට ලක් කර ඇත. ශ්‍රී ලංකා අධ්‍යාපන සන්දර්භය තුළ පළමු ශ්‍රේණියේ සිට දහතුන් වන ශ්‍රේණිය දක්වා නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක වේ. එසේම එය විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයකට නැඹුරු වන අතර (ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 2016). අනුව ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයක හා සබැඳි ජාතික මට්ටම් තුනක විභාග තුනක් පැවැත්වේ. එනම් 05 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, 11 වන ශ්‍රේණියේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සහ 13 වන ශ්‍රේණිය අවසානයේ පවත්වනු ලබන අ.පො.ස.(උ.පෙළ) විභාගය යනුවෙනි (ජාතික අධ්‍යාපන කොමිසම, 2016). අ.පො.ස.(සා.පෙළ) විභාගය ළමයෙකුගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය වන අතර එය සමත් වන සිසුන්ට අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් වී විශ්ව විද්‍යාල වරම් ලැබිය හැකිය. විශ්ව විද්‍යාල ප්‍රවේශය අතිශය තරගකාරී වන අතර ශිෂ්‍යයෙකුගේ අනාගතය රඳා පවතින්නේ මෙම විභාගයේදී ලබාගන්නා ලද කාර්ය සාධනය මතය. වැඩිපුර කරුණු දක්වමින් ජීවිතය සාර්ථක කර ගැනීම පිණිස ශිෂ්‍යයන් විසින් ලබාගත යුතු දැනුම, කුසලතා සහ ඥානය ගැන 21 වන සියවසේ ඉගෙනීම සඳහා වන රාමු පද්ධතියෙන් අවධාරණය කරයි. ප්‍රජානන, මනෝ චාලක හා ආවේදන යන අධ්‍යාපන ක්ෂේත්‍රවලට අදාල ප්‍රසිද්ධ විභාගවල ප්‍රශ්න පත්‍ර ආකෘති සහ පරීක්ෂණ අතර සමතුලිතතාව නොමැති වීම හේතුවෙන් ඒවා විවේචනයට ලක් කර ඇත. විෂය මාලාව සහ විභාග යල් පැන ගිය ආකෘති මත දිගින් දිගටම සිදුකරන බැවින් අධ්‍යාපනයෙන් නිර්මාණශීලීත්වය හා උසස් ප්‍රජානන හැකියාව වර්ධනය කිරීමේ අවශ්‍යතාවයද පවතී.

මෙම පර්යේෂණයෙන් ලබා ගන්නා ප්‍රධාන වැදගත්කම වන්නේ දෘශ්‍යාබාධිත දරුවන්ගේ අධ්‍යාපනය තුළ පවතින අධ්‍යාපනික ක්‍රම වැඩිදියුණු කිරීම, නවීන ක්‍රම භාවිතයට ගැනීම, සමාජයේ සම්බන්ධතා පවත්වා ගැනීමට සහ මොවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා පවුලේ සහාය ලබාදීම යනාදියයි. දෘශ්‍යාබාධිත දරුවන් සඳහා සමාජ සේවා මැදිහත්වීම් හඳුනාගැනීම, ඔවුන්ගේ අධ්‍යාපනික සහ සමාජ කුසලතා වර්ධනය කිරීමට කටයුතු කිරීම, යනාදී මැදිහත්වීම් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීමට සහය ලබාදෙන බවයි (Fernando, 2009). එසේම මෙම පර්යේෂණ වලට අනුව, පුද්ගල කේන්ද්‍රීය මැදිහත්වීම් සහ පවුල කේන්ද්‍ර කරගත් පුහුණුව මගින් දරුවන්ගේ අධ්‍යාපනික සංවර්ධනයට සහ ඔවුන්ගේ සමාජ සහ ආර්ථික ස්ථාවරතාවයට විශේෂයෙන් වැදගත් බව (Perera, 2006) පර්යේෂණයෙන් පැහැදිලි කර ඇත.

ඒ අනුව මනුෂ්‍යයන්ට උපතින් විවිධ හැකියාවන් උරුම වන අතර ඇතමෙකු තමාගේ හැකියාවන් හඳුනා ගනිමින් වර්ධනය කරගන්නා අතර තවත් අයෙකුට තමන්ගේ දක්ෂතාවයන් හරිහැටි හඳුනා ගැනීමට නොහැකි වීමෙන් තමන්ට නොගැලපෙන උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයන් හෝ නොගැලපෙන රැකියාවන්වල නිරත වේ. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන අධ්‍යාපන ක්‍රමයේ ඇතැම් හිඩැස් සහ පරස්පර මූලයන් හේතුවෙන් මෙම

ගැටලුකාරී තත්ත්වයන් සඳහා බහුතරයක් දරුවන් මුහුණ දීම දක්නට ලැබේ (පෙරේරා, 2018). රටක අධ්‍යාපන ක්‍රියාවලිය හරහා බිහිවන දරුවන් රටේ අනාගත ආයෝජනය වන්නේ එයින් ලබා ගන්නා විධිමත් හා සාර්ථක අධ්‍යාපනයක් ක්‍රියාත්මක වීම හරහාය (world bank, 2020).

ප්‍රථම බිහිරි හා අන්ධ පාසල ආරම්භ කළ 1912 වර්ෂය වැනි ඈත කාලයක පටන් ආබාධ සහිත දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි විශේෂිත අවධානයක් යොමු කිරීමේ සම්ප්‍රදායක් ශ්‍රී ලංකාවේ පවතී. 1970 දශකයේ මුල් කාලයේදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සමෝධානය මගින් මෙම දරුවන් සඳහා අධ්‍යාපන අවස්ථා වැඩිකරලීම ආරම්භ කරන ලදී. වඩාත් මෑතකදී ජාත්‍යන්තර වර්ධනයන්ට අනුකූලව සහ විශේෂයෙන්ම ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සම්මත කර ගැනීමත් සමඟ අන්තර්කරණ අධ්‍යාපනය කෙරෙහි අවධාරණයක් දැකිය හැකිය. දැනට ආබාධ සහිත ළමයි රජයේ පාසල්වල සාමාන්‍ය පන්තිවලට ඇතුළත්ව හෝ සාමාන්‍ය පාසල්වලට අනුබද්ධිත විශේෂ අධ්‍යාපන ඒකකවල අධ්‍යාපනය ලබති. සිය කැමැත්තෙන් සම්බන්ධ වන අය හෝ මෙම ධාරාවන් දෙකින් එකකට නොගැලපෙන අය රාජ්‍ය නොවන සංවිධාන විසින් සහ පෞද්ගලික අංශය විසින් පවත්වාගෙන යනු ලබන විශේෂ පාසල් වල අධ්‍යාපනය ලබති" (ආබාධිත බව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය, 2003). දෘශ්‍යාබාධිත දරුවන් සඳහා විශේෂ ඒකක සහ පාසල් පැවතුන ද, විශේෂ අධ්‍යාපනයට ප්‍රවේශ වීමට බාධා පවතී. විශේෂ අධ්‍යාපන ඒකක සහිත ග්‍රාමීය පාසල් සීමිත සංඛ්‍යාවක්, සාමාන්‍ය පාසල් වලට ආබාධ සහිත දරුවන් ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කරන පරිපාලකයින්, සුදුසුකම් ලත් ගුරුවරුන් ප්‍රමාණවත් නොවීම සහ පවතින අධ්‍යාපන පහසුකම් සම්බන්ධයෙන් දෙමව්පියන් අතර ඇති දැනුවත්භාවය අඩුවීම (Furuta, 2006, UNICEF ROSA, 2007). ආබාධ සහිත ළමුන් සඳහා පාසල් අධ්‍යාපනයේ විභව ප්‍රතිලාභ පිළිබඳ සමාජයේ සාමාන්‍ය දැනුවත්භාවය නොමැතිකම මෙම ගැටළු තවදුරටත් උග්‍ර කරයි (Furuta, M. 2009). ඒ අනුව මෙම පාසල්වල ඉගෙනුම ලබන දෘශ්‍යාබාධිත දරුවන්ගේ අධ්‍යාපන ක්‍රමවේද සහ එහි පවතින ගැටලු හඳුනාගෙන සමාජ වැඩකරුවෙකු වශයෙන් මැදිහත්වීම සිදු කරනු ලබන්නේ කෙසේද යන්න කරුණු විසඳීම මෙහිදී වැවගත් වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත සිසුන්ගේ අධ්‍යාපන තත්ත්වය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ඉගෙනුම් ක්‍රමවේද හඳුනා ගනිමින් එම ක්‍රමවේදයන් තුළින් දෘශ්‍යාබාධිත ප්‍රජාවේ අධ්‍යාපන ඉලක්ක සංවර්ධනය කිරීම උදෙසා සමාජ වැඩ උපායමාර්ග හඳුනා ගැනීම වේ. එය ගැඹුරු ලෙස අධ්‍යනය කිරීමට මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය (Mixed Methods) යොදා ගන්නා ලදී. දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණය යොදා ගත් අතර ප්‍රධාන පාර්ශවකරුවන් ලෙස දෘශ්‍යාබාධිත ශිෂ්‍යයන්, ගුරුවරුන් සහ අධ්‍යාපන පරිපාලකයින් සම්බන්ධ කරගන්නා ලදී. මේ සඳහා අසම්භාවී අරමුණුගත නියැදි ක්‍රමය යොදා ගෙන වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ සඳගල විශේෂ විද්‍යාලයේ 13–16 වයස් කාණ්ඩයට අයත් ශිෂ්‍යයින් 14 දෙනෙකු සහ ගුරුවරුන් 06 දෙනෙකු නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. රැස්කරගත් දත්ත

SPSS මගින් සංඛ්‍යාත්මකව, තේමාගත විශ්ලේෂණය මගින් ගුණාත්මකවද විශ්ලේෂණය කර ඇත. එමගින් දෘශ්‍යාබාධිත සිසුන් සඳහා ක්‍රියාත්මක ඉගෙනුම් ක්‍රමවේද, පවතින බාධක සහ අධ්‍යාපනය සාර්ථක කරන්න අවශ්‍ය සමාජ වැඩ මැදිහත්වීම් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට හැකි වන අතර පර්යේෂණයේ නිගමන හා යෝජනා ඒ සඳහා වැඩි දායකත්වයක් ලබා දෙයි.

න්‍යායාත්මක පදනම

1. ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත සිසුන්ගේ අධ්‍යාපනය කෙරෙහි ඉගෙනුම් ක්‍රමවේදයන්හි බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීමේදී, යූරි බොන්ෆ්‍රෙන් බ්‍රෙනර්ගේ පාරිසරික පද්ධති න්‍යාය මගින්, පුද්ගලයාගේ සංවර්ධනය ආසන්න වටපිටාවේ සිට පුළුල් සමාජ ව්‍යුහයන් දක්වා වූ අන්තර් සම්බන්ධිත පාරිසරික පද්ධති මගින් බලපෑම් ඇති කරන බව පෙන්වා දේ. ඒ අනුව ක්ෂුද්‍ර පද්ධතිය, මෙසෝසිස්ටම්, එක්සොසිස්ටම්, මැක්‍රොසිස්ටම් සහ ක්‍රොනෝසොස්ටම් ඇතුලත් වන අතර ඒවා මගින් පුද්ගලයාගේ වර්ධනයට සහ හැසිරීමට විවිධ මට්ටමේ පාරිසරික බලපෑම් ඇති කරන බව විමර්ශනය කරයි. ඒ අනුව දෘශ්‍යාබාධිත දරුවන්ගේ අධ්‍යාපන ක්‍රියාවලිය තුළ පුද්ගලයාගේ සංවර්ධනය සඳහා දෙමව්පියන් මෙන්ම සමස්ත සමාජයේම සහයෝගය අවශ්‍ය වන බව මෙම න්‍යාය හරහා විග්‍රහ කළ හැක.
2. 1884 දී කොල්බ්ගේ අත්දැකීම් න්‍යාය මගින් ඩී.ඒ.කොල්බ් විසින් ඉගෙන ගැනීම යනු අත්දැකීම් පරිවර්තනය තුළින් දැනුම නිර්මාණය වන ක්‍රියාවලියක් බව පෙන්වා දී ඇත. මෙය චක්‍රයක් ආකාරයෙන් සිදුවන ක්‍රියාවලියකි. මෙම න්‍යාය භාවිතා කරමින් දෘශ්‍යාබාධිත සිසුන්ට තොරතුරු රඳවා ගැනීමට සහ කරුණු සිහිපත් කිරීමට උපකාර කළ හැකි අත්දැකීම් හරහා ඉගෙන ගැනීමට උනන්දු කළ හැක. එමෙන්ම දෘශ්‍යාබාධිත දරුවන්ගේ අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ඔවුන් අධ්‍යාපනය ලබාගන්නා විවිධ වූ ක්‍රමවේදයන් ආශ්‍රයෙන් විවිධ අත්දැකීම් ලබා ගනිමින්, සාමාන්‍ය දරුවෙකු ලබන අධ්‍යාපන ක්‍රමයකට වඩා වෙනස් ආකාරයෙන් අධ්‍යාපනය ලබන බව අවධාරණය කරයි.


අධ්‍යයන අනාවරණයන්

ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත සිසුන්ගේ අධ්‍යාපන පද්ධතියෙහි ක්‍රියාත්මක වන ඉගෙනුම් ක්‍රමවේද

දෘශ්‍යාබාධිත සිසුන් භාවිතා කරන අධ්‍යාපන ක්‍රම ලෙසට බ්‍රේල් ක්‍රමය, ශ්‍රව්‍ය පාඨ, ටේප් රෙකෝඩර්, පරිගණක සහ තාක්ෂණය, සංවාදාත්මක ඉගැනීම සහ අත්දැකීම් මත පදනම් වූ ඉගෙනීම මේ ඔස්සේ පෙන්වාදිය හැකිය. අධ්‍යාපනයේදී මොවුන්ට වෙනත් පුද්ගලයෙකුගේ උපකාරයක් අවශ්‍ය වන බැවින් මෙම අධ්‍යාපන ක්‍රමවේද අන් සාමාන්‍ය ක්‍රමයන්ගෙන් වෙනස් වේ. මෙහිදී ඕනෑම දෘශ්‍යාබාධිත පුද්ගලයෙකු දැන සිටියයුතුම අධ්‍යාපනය ක්‍රමවේදය වන්නේ බ්‍රේල් ක්‍රමයයි. එනම් ලිවීමට හා කියවීමට එය දැන සිටිය යුතුමය. මූලික අක්ෂර මෙන්ම ගණිත සංකේත අධ්‍යාපනය සඳහා බ්‍රේල් පරිගණක හෝ

යන්ත්‍රද භාවිතා කළ හැකිය. ශ්‍රව්‍ය පාඨ මගින් අධ්‍යාපනය ලැබීමේදී මොවුන්ට අවශ්‍ය විවිධ පොත් නැවත නැවත සවන් දීමට හැකියාව පවතින බැවින් එය සහයෝගය ඇති කරයි. වර්තමානය වන විට තාක්ෂණික සහාය ලබාගැනීමට හැකිවීම විශේෂිතය. නමුත් දෘෂ්‍යාබාධිත දරුවන් සඳහා එම පරිගණක සහ තාක්ෂණය පිළිබඳව දැනුම ලබාදීමට පුහුණු ගුරුවරු සිටිය යුතුමය. එසේම මෙම සියලුම අධ්‍යාපනික ක්‍රම මගින් දෘශ්‍යාබාධිත සිසුන්ට ආරක්ෂිත හා උපයෝගී වාතාවරණයක් සැලසීමේදී ගුරුවරුන්ගේ පුහුණුව ඉතාම වැදගත් වේ. දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ අධ්‍යාපන ක්‍රමවේද දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා සකස් කරන ලද විශේෂිත අධ්‍යාපන ක්‍රමවේද වේ. මෙහිදී ඔවුන්ගේ ආකල්ප, කුසලතා, හා සමාජ සාමූහිකත්වය වර්ධනය කර ගැනීමට සහාය ලබා දෙයි.

ප්‍රස්ථාර සටහන් - 1.1
දෘශ්‍යාබාධිත සිසුන්ගේ අධ්‍යාපන ක්‍රම




මූලාශ්‍රය : (ක්ෂේත්‍ර දත්ත,2024)


මෙහිදී දෘශ්‍යාබාධිත සිසුන් අධ්‍යාපන ක්‍රමයන්ගෙන් වඩාත් රුචිකත්වයක් පෙන්වන්නේ සංවාදාත්මක ඉගෙනීමටය. එය 24% කි. එහිදී සවන්දීමෙන් හා ප්‍රශ්න කිරීම මගින් කරුණු ධාරණය කර ගැනීම සිදුකරයි. එසේම බ්‍රේල් ක්‍රමය හා අත්දැකීම් මත පදනම් වූ ඉගෙනීම සහ ටේප් රෙකෝඩර් සඳහා 17% කි. ශ්‍රව්‍ය පාඨ සඳහා 13% ක්ද පරිගණක සහ තාක්ෂණය 12% ක්ද වශයෙන් පෙන්වා දිය හැකිය (ක්ෂේත්‍ර දත්ත, 2024). මේ අනුව පැහැදිලි වන්නේ සංවාදාත්මක ඉගැනීම මොවුන්ට ඉගෙනුම් ක්‍රියාවලියේදී පහසුව සපයන බවය.

දෘශ්‍යාබාධිත සිසුන් සඳහා පවතින අධ්‍යාපනික උපකරණ

මෙහිදී දෘශ්‍යාබාධිත සිසුන් සඳහා පවතින අධ්‍යාපනික උපකරණ ලෙස ස්ලේට්, බ්‍රේල් රයිටර්, ඇබකසය, නම්බර් බෝඩ්, කථන පරිගණක, කථන පුස්තක, බ්‍රේල් ඩිස්ප්ලේ, බ්‍රේල් පොත්, ටේප් රෙකෝඩර් සහ ඩේසි උපකරණ භාවිතා කරන බව හඳුනා ගැනුණි. බ්‍රේල්

ලිවීම සඳහා භාවිතා කරනු ලබන්නේ ස්ලේට් එකය. ඇබකසය ගණිතය ඉගෙන ගැනීමට අවශ්‍ය වේ. බ්‍රේල් පොත් මගින් ඔවුන්ට තනිවම අධ්‍යාපනය ලැබීමට හැකියාව ඇති කරයි. නමුත් එවැනි පොත් ඉතාමත් සීමිතය. කථන පුස්තක හා කථන පරිගණක මගින් අධ්‍යාපනය ලැබීම පහසු වුවද පෙළපොත් කථන පුස්තක බවට පරිවර්තනය කර නොමැත.

ප්‍රස්ථාර සටහන් - 1.2
දෘශ්‍යාබාධිත සිසුන්ගේ අධ්‍යාපනික උපකරණ




මූලාශ්‍රය : (ක්ෂේත්‍ර දත්ත,2024)

මේ අතරින් මෙම ශිෂ්‍යයන් කථන පුස්තක හා ටේප් රෙකෝඩර් 15% ක් භාවිතා කරනු ලැබේ. එය නැවත වරක් සවන් දීමට හැකි බැවින් මොවුන්ට ප්‍රයෝජනවත් උපකරණයකි. එසේම බ්‍රේල් පොත් සඳහා 14% ක්ද ස්ලේට් සහ බ්‍රේල් රයිටර් සඳහා 11% ක්ද පෙන්නුම් කරයි. එසේම මෙහිදී බ්‍රේල් ඩිස්ප්ලේ සහ ඩේසි උපකරණ සඳහා 0% ක ප්‍රතිශතයක් පෙන්වනු ලබන අතර එමගින් පැහැදිලි වන්නේ පාසල තුළ සහ මෙම සිසුන් එම උපකරණ භාවිතයට නොගන්නා බවය.


දෘශ්‍යාබාධිත සිසුන් භාවිත කරන සන්නිවේදන උපක්‍රම

දෘශ්‍යාබාධිත සිසුන් සන්නිවේදනය හරහා අධ්‍යාපනය ලබයි. මෙහිදී ඔවුන් විවිධ සන්නිවේදන උපක්‍රම භාවිතයට ගනු ලැබේ. ඒවා කථන ග්‍රන්ථ, ගුවන් විදුලිය, රූපවාහිනිය, පරිගණකය , කියවන විට සවන් දීම සහ විශාල මුද්‍රිත අකුරු සහිත පොත් යනාදී ක්‍රම මගින් අධ්‍යාපනය ලබයි. මොවුන් සන්නිවේදනය හරහා අධ්‍යාපනය ලබන බැවින් කථන ග්‍රන්ථ පහසුව ඇති කරවයි. නමුත් අධ්‍යාපනික පෙළපොත් කථන ග්‍රන්ථ ආකාරයට ලබාගත නොහැකි වීම ගැටලුවකි. රූපවාහිනිය හා ගුවන් විදුලිය වෙත සවන් දීම මගින් ද බොහෝ දැනුම ලබාගත හැකිය. මෙහිදී බාහිර සමාජයේ සිදුවන දේ පිළිබඳව අවබෝධය ලබා ගැනීමට හැකියාව පවතී. මෙමගින් වඩාත් වැදගත් ක්‍රමයෙන් ලෙස කියවන විට සවන් දීම

පෙන්වා දියහැකිය. පාසල තුළදී බොහෝවිට මොවුන් අධ්‍යාපනය ලබන්නේ ගුරුවරයා පවසන දෙය ධාරණය කරගනිමිනි. එය සංවාදාත්මක ලෙස ගැටලු හා අදහස් ඉදිරිපත් කරමින් දැනුම ලබා ගතහැකිය. මෙය ගුරුවරයාට අපහසු වුවත් ශිෂ්‍යයාට සුදුසුම ක්‍රමවේදය වේ. මෙම සන්නිවේදන ක්‍රම භාවිතයෙන් දෘශ්‍යාබාධිත සිසුන්ගේ අධ්‍යාපනික හා සමාජයීය දැනුම වඩාත් ක්‍රියාශීලී හා සාර්ථක කරගත හැක.

ප්‍රස්ථාර සටහන්- 1.3

සන්නිවේදන උපක්‍රම





මූලාශ්‍රය : (ක්ෂේත්‍ර දත්ත,2024)

මෙම ශිෂ්‍යයන් කථන ග්‍රන්ථ හා කියවන විට සවන් දීම 25% ක ප්‍රමාණයක් භාවිතා කරයි. ශ්‍රවන් විදුලිය හරහා 20%ක්ද පරිගණකය 12% , රූපවාහිනිය 10% හා විශාල මුද්‍රිත අකුරු සහිත පොත් මගින් 8% ක ප්‍රමාණයක්ද සන්නිවේදන උපක්‍රම ලෙස භාවිතා කරයි. මේ අනුව ඔවුන්ගෙන් බොහෝ දෙනකුට පහසු ක්‍රමය වන්නේ කියවන විට සවන් දීම මගින් හා කථන ග්‍රන්ථ මගින් අධ්‍යාපන තොරතුරු ධාරණය කර ගැනීමයි. එය ප්‍රබල සන්නිවේදන උපක්‍රමයක් ලෙස වටහාගත හැකිය.

අධ්‍යාපන ක්‍රමවල සහය

දෘෂ්‍යාබාධිත සිසුන් අධ්‍යාපනය සඳහා බ්‍රේල් ක්‍රමය, ශ්‍රව්‍ය පාඨ, ටේප් රෙකෝඩර්, පරිගණක සහ තාක්ෂණය, සංවාදාත්මක ඉගැනීම සහ අත්දැකීම් මත පදනම් වූ ඉගෙනීම යනාදිය භාවිතයට ගනු ලැබේ. මෙලෙස බොහෝ ක්‍රමවේද පැවැතියද එක් එක් ශිෂ්‍යයාට පුරුදු සහ පහසුම ක්‍රමවේදය එකිනෙකාට වෙනස්ය. තමන්ට ධාරණය කර ගැනීමට පහසුම ක්‍රමවේදය ඔවුන් අධ්‍යාපනය සඳහා භාවිතා කරයි. එමගින් ඔවුන් ඉතා කැමැත්තෙන් අධ්‍යාපන කටයුතුවල නිරත වේ.

ප්‍රස්ථාර සටහන් - 1.3
අධ්‍යාපන ක්‍රමවල සහය





මූලාශ්‍රය : (ක්ෂේත්‍ර දත්ත,2024)

මෙම ක්‍රම අතරින් බහුතරයකගේ අධ්‍යාපනයට සහාය දක්වනු ලබන්නේ බ්‍රේල් ක්‍රමයයි. එය 43% කි. සංවාදාත්මක ඉගෙනීම සඳහා 22% ප්‍රතිශතයක් පෙන්වනු ලැබේ. එසේම ශ්‍රව්‍ය පාඨ හා පරිගණක සහ තාක්ෂණය මගින් 14% ක සහයෝගීතාවයක් අධ්‍යාපනය සඳහා ලබා ගනී. ටේප් රෙකෝඩර් මගින් 7% ක ප්‍රමාණයට සහයක් ලැබේ. ඕනෑම දෘශ්‍යාබාධිතයෙකු සඳහා බ්‍රේල් ක්‍රමය අත්‍යවශ්‍ය ඉගෙනුම් ක්‍රමයක් බැවින් එය අධ්‍යාපනයේ සඳහා ඉහළ සහයක් ලබා දෙන බව මෙමගින් අවධාරණය කරයි. එනම් අධ්‍යාපන ක්‍රමවේදයන්ගේ ඵලදායිතාවය ඉහළම ක්‍රමවේදය වන්නේ බ්‍රේල් ක්‍රමයයි.

ඉගෙනුම් උපකරණ අධ්‍යාපනයට ලබා දෙන සහය

ප්‍රස්ථාර සටහන්- 1.4
අධ්‍යාපනයට ලැබෙන සහය





මූලාශ්‍රය : (ක්ෂේත්‍ර දත්ත,2024)

දෘශ්‍යාබාධිත දරුවන් අධ්‍යාපනය තුළදී විවිධ වූ ඉගෙනුම් ක්‍රම මගින් අධ්‍යාපනය ලැබීම සිදුකරයි. මෙහිදී එම උපකරණ වලින් ලබනෙන සහය 93% ක් වැනි විශාල අගයකින් ප්‍රමාණවත් ලෙස සහයක් ලැබෙන බව මොවුන් පෙන්වා දෙයි. එය ඉතාමත් වැදගත් කරුණකි.

ඉගෙනුම් ක්‍රමවේද තුළ මුහුණ දෙන අභියෝග

දෘෂ්‍යාබාධිත සිසුන් අධ්‍යාපනය තුළ විවිධ වූ අභියෝගයන්ට මුහුණ දෙනු ලැබේ. ඔවුන්ට අනුව නිරීක්‍ෂණය තුළින් ප්‍රතිචාර දැක්වීමේ අපහසුතාවය, බ්‍රේල් මාධ්‍යයෙන් තොරතුරු ලබා ගැනීමට සම්පත් නොමැති වීම, පින්තූර හඳුනා ගැනීමේ අපහසුතාවය, පුහුණු සම්පත් දායකයින් හිඟකම සහ වෙනත් නව තාක්ෂණික උපකරණ හිඟය මෙම ශිෂ්‍යයන් ඉගෙනුම් ක්‍රමවේද තුළ මුහුණ දෙන අභියෝගයන් ලෙස පෙන්වා දියහැකිය. නිරීක්ෂණය තුළින් ප්‍රතිචාර දැක්වීමේ අපහසුතාවය ගත්කළ මොවුන්ට යමක් බලා ප්‍රතිචාර දැක්වීමට අපහසු බැවින් පාසල් අධ්‍යාපනය තුළදී ගුරුවරුන්ට යම් වස්තුවක් පිළිබඳව ප්‍රකාශ කරන විට එහි හැඩය, ප්‍රමාණය සහ එය සිසුන්ට අල්ලා බැලීම මගින් නිරීක්ෂණය කිරීමට සහාය ලබා දේ. එසේම පින්තූර හඳුනා ගැනීමේ අපහසුතාවයද මොවුන්ට පවතින හෙයින් මෙහිදී යම් පින්තූරයක් විස්තර කරන එහි අතීතය පිළිබඳව, එම නිර්මාණය සිදුකළ පුද්ගලයා පිළිබඳව පවසා එම සංඥාවන් ඔස්සේ සිසුන්ගෙන් ඒ පිළිබඳව පිළිතුර ලබාගත හැකිය. එසේම එම්බරොයිඩර් හෝ නූල් යැවීම මගින් පින්තූර හඳුනා ගැනීමට අවකාශය ලබාදිය හැකිය. මෙම ශිෂ්‍යයන් සඳහා වර්තමානය වන විට විවිධ වූ තාක්ෂණික ක්‍රමයන් පවතී. මේ සඳහා තාක්ෂණික උපකරණ පැවතිය යුතුය. එහෙයින් මෙවැනි ආබාධ සහිත පාසල් දරුවන් සඳහා එවැනි නවීන උපකරණ ලබාදීමට රජය කටයුතු කළ යුතුය. මේ අනුව පෙනී යන්නේ දෘශ්‍යාබාධිත සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය තුළ ඔවුන් මුහුණ දෙන අභියෝග විවිධ බවයි. මෙම අභියෝග ඔවුන්ගේ අධ්‍යාපනයේ සාර්ථකතාවය පමණක් නොව, සමාජ ජීවිතයටද බලපෑම් කරයි. මෙම අභියෝග ජය ගැනීම සඳහා ගුරුවරුන්ට විශේෂිත ගුරු පුහුණුව ලබාදීම, සමාජ සම්බන්ධතා ඇතිකිරීම හා ආධාරක උපකරණ වර්ධනය කිරීම, තාක්ෂණික ප්‍රවේශය වැඩි කිරීම, නිවැරදි අධ්‍යාපන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සිදු කළ හැකිය.

ප්‍රස්ථාර සටහන් - 1.5
ඉගෙනුම් ක්‍රමවේද තුළ මුහුණ දෙන අභියෝග




මූලාශ්‍රය : (ක්ෂේත්‍ර දත්ත,2024)


මේ අතරින් 25% ක් පින්තූර හඳුනා ගැනීමේ අපහසුතාවයට පත්ව ඇත. මෙය ඔවුන්ගේ විභාග වලදී බලපාන ගැටලුකාරී තත්ත්වයකි. එසේම නිරීක්ෂණය තුළින් ප්‍රතිචාර දැක්වීමේ අපහසුතාවය 23% ක්ද බ්‍රේල් මාගින් තොරතුරු ලබා ගැනීමට සම්පත් නොමැතිවීම සහ වෙනත් නව තාක්ෂණික උපකරණ හිඟය 18% ද පුහුණු සම්පත් දායකයින් හිඟකම 16% වශයෙන් පෙන්වා දිය හැක. මෙය ඔවුන්ට අධ්‍යාපනය තුළදී විශාල අභියෝගයක් බවට පත්ව ඇත.

පවුල තුළින් ලැබෙන සහය

දෘශ්‍යාබාධිත දරුවන් සඳහා අධ්‍යාපනය තුළදී පවුල තුළින් ලැබෙන සහය ඉතාම ඉහළ අගයක් ගනී. දෘශ්‍යයාබාධිත සිසුන්ගේ අධ්‍යාපනික හා සමාජීය වර්ධනය සඳහා පවුලේ සහාය ඉතා වැදගත් වේ. පවුල, සිසුන්ට උපකාරක පද්ධතියක් ලෙස ක්‍රියා කරමින් ඔවුන්ගේ විශේෂිත අවශ්‍යතා අවබෝධ කරගනිමින් ඒ අනුව සහාය ලබාදීම කළ යුතුය. දරුවන්ගේ සුළු වෙනස්කමක් පවා ක්ෂණිකව හඳුනා ගැනීමට හැකියාව පවතින්නේ දෙමාපියන්ටය. එබැවින් පවුල මේ සඳහා විශේෂිත වේ. දරුවා තුළ ආත්ම විශ්වාසය ගොඩනැංවීමට, ඔවුන්ව දිරි ගැන්වීමට, අධ්‍යාපනික කටයුතු සඳහා සහාය ලබාදීමට, කුඩා කළ සිටම දරුවා සමාජයට මුහුකිරීමට, සමාජ අන්තර් සම්බන්ධතා ඇති කිරීමට, දරුවා තුළ පවතින දක්ෂතා අගය කිරීම යනාදී වශයෙන් නොයෙක් ලෙස පහසුකම් සැලසීම පවුල තුළින් සිදු කළ හැකිය. එය මෙවැනි විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට ධෛර්යය ඇති කරවන්නකි.

ප්‍රස්ථාර සටහන් - 1.6

පවුල තුළින් ලැබෙන සහාය




මූලාශ්‍රය : (ක්ෂේත්‍ර දත්ත,2024)


මෙහිදී 43% පවසන්නේ ප්‍රමාණවත් සහයක් පවුල තුළින් නොලැබෙන බවයි. මෙම ශිෂ්‍යයන් අතුරින් 7% ක් වැනි කුඩා ප්‍රමාණයකට පමණක් පවුල තුළින් ලැබෙන සහාය

ප්‍රමාණවත් වේ. ඒ අනුව පැහැදිලි වන්නේ 93% ක් වැනි ඉහළ ප්‍රතිශතයකට පවුලේ සහාය නිසි පරිදි නොලැබෙන බවයි.

ගුරුවරුන්ගේ සහය

පාසල් අධ්‍යාපනය ලබන මෙවැනි දෘශ්‍යාබාධිත දරුවන් සඳහා පාසල තුළින් ලැබෙන සහය ඉතාමත් වැදගත්ය. මන්ද පාසල් අධ්‍යාපනය තුළින් ඔවුන්ව දැනුමෙන් පෝෂණය කරන බැවිනි. දෘශ්‍යාබාධිත සිසුන්ගේ අධ්‍යාපනික හා සමාජීය වර්ධනයට ගුරුවරුන්ගෙන් විශාල සහයක් අත්‍යවශ්‍ය වේ. ගුරුවරුන්ගේ අවධානය, මනෝභාවය සහ නිවැරදි ඉගැන්වීමේ ක්‍රමවේද භාවිතය මෙහිදී වැදගත් වේ. එය මෙම සිසුන්ට ජීවිතය සාර්ථක කර ගැනීමට සහය වේ. මෙහිදී ශිෂ්‍යයාගේ හැකියාවන් පිළිගනිමින්, ඔවුන්ට ආත්ම විශ්වාසය ඇති කිරීමට කටයුතු කිරීම, සිසුන්ගේ දුර්වලතා වෙනුවට දක්ෂතාවයන් වෙත අවධානය යොමු කිරීම, පන්ති කටයුතු සඳහා නිවැරදි ඉගෙනුම් වටපිටාවක් සැකසීම, සමාජ සම්බන්ධතා වර්ධනයට සහායවීම, දෘෂ්‍යාබාධිත සිසුන් වෙනත් සිසුන් සමඟ සම්බන්ධ කරමින් සමාජ සම්බන්ධතා වර්ධනය කිරීම, ඔවුන්ගේ දක්ෂතා ඉදිරිපත් කිරීම සඳහා විවිධ වැඩසටහන් සූදානම් කිරීම සහ අනාගතය සඳහා අවශ්‍ය සමාජීය හා වෘත්තීය මඟපෙන්වීම් ලබා දීම සිදුකළ හැකිය. මෙහිදී ගුරුවරුන්ගේ නිවැරදි සහය හා අවධානය, දෘශ්‍යාබාධිත සිසුන්ගේ අධ්‍යාපනික ජීවිතය සහ සමාජ ජීවිතය සාර්ථක ලෙස ගොඩනංවා ගැනීමට උපකාර කරයි.

ප්‍රස්ථාර සටහන් - 1.7
ගුරුවරුන්ගේ සහය




මූලාශ්‍රය : (ක්ෂේත්‍ර දත්ත,2024)

මෙම දරුවන් පවසන පරිදි 36% ක් ප්‍රමාණවත් සහයක් ලබා දෙයි. එසේම 57% දක්වන්නේ සාමාන්‍ය මට්ටමක සහයක් ලැබෙන බවයි. ඒ අනුව මෙම ආබාධිත දරුවන් සඳහා තවදුරටත් ප්‍රමාණවත් සහයක් ලබා දිය යුතු බව පැහැදිලිය. එමගින් ඔවුන්ගේ අධ්‍යාපන තත්ත්වය වැඩි කර කරගත හැකිය.

**සමාජ වැඩ මැදිහත්කරණය**

දරුවන්ගේ අධ්‍යාපනික හා මානසික සුවය උදෙසා සමාජ සේවා මැදිහත්කරණය ක්ෂුද්‍ර, මධ්‍ය සහ සාර්ව මට්ටම් තුළ ක්‍රියාත්මක විය යුතු වේ. ක්ෂුද්‍ර මට්ටමේදී, දරුවන්ගේ මානසික සෞඛ්‍ය වර්ධනය සඳහා මනෝ-සමාජීය උපදේශන සේවා ලබාදීම, අධ්‍යාපනික සම්පත් සම්බන්ධීකරණය හරහා පාසල් උපකරණ හා අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම, දෙමාපියන් සහ දරුවන් අධ්‍යාපනය හා අනාගත අපේක්ෂා පිළිබඳ දැනුවත් කර සවිබල ගැන්වීම, රජයේ අරමුදල් හා ශිෂ්‍යත්ව ලබා ගැනීම සඳහා යොමු කිරීම යන සේවාවන් දියුණු කරයි. මධ්‍ය මට්ටමේදී, ප්‍රජා සංවිධාන, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා සම්පත් සම්බන්ධ කරමින් දරුවන්ගේ සවිබල ගැන්වීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, විවිධ ආයතන සම්බන්ධ කර සමාජ ක්‍රියාකාරකම්වලට දරුවන්ගේ විශේෂ සහභාගීත්වය වැඩි කිරීම, වෘත්තීය අධ්‍යාපනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඔවුන්ගේ දීර්ඝකාලීන දක්ෂතා සංවර්ධනය සිදු කරයි. සාර්ව මට්ටමේ මැදිහත්කරණය තුළ, දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට සහය දැක්වීම, රජයේ අධ්‍යාපනික සහන සහ ජාතික මට්ටමේ සවිබල ගැන්වීමේ වැඩසටහන් පිහිටුවීම, සමාජය තත්ත්වය පිළිබඳ දැනුවත් කර ආන්තීකරණයට පත් ප්‍රජාවට සමාජ සහයෝගය ඇති කිරීම සහ ප්‍රතිපත්ති හා ව්‍යාපෘති නියෝජනය සඳහා අවශ්‍ය පර්යේෂණ සිදුකිරීම ආදී මැදිහත්කරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතු වේ.

**නිගමන යෝජනා**

දෘශ්‍යාබාධිත දරුවන්ගේ අධ්‍යාපනය සහ සමාජීය සවිබලගැන්වීම සඳහා බහුවිධ මැදිහත්කරණ අවශ්‍ය වේ. මෙහිදී, තාක්ෂණික උපකරණ දියුණු කර පාසල් තුළ අවශ්‍ය උපකරණ හා මෘදුකාංග ලබාදීම මෙන්ම බ්‍රේල් පෙළපොත් මුද්‍රණය හා බෙදාහැරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතුය. එමඟින් දෘශ්‍යාබාධිත දරුවන්ට පරිගණක සහාය භාවිතයෙන් මුද්‍රිත ලිපි කියවීමේ පහසුකම් වැඩි දියුණු කළ යුතුය. අධ්‍යාපන කටයුතු සඳහා රජයේ මැදිහත්වීම් ශක්තිමත් කිරීමත්, පාසල තුළ ඔවුන්ට ගැළපෙන සහාය කණ්ඩායම් නිර්මාණය කිරීමත් ඉතා වැදගත්ය. සමාජයේ වෘත්තීය, සමාජීය හා දේශපාලන ක්ෂේත්‍රවල ඔවුන්ට සෘජු සහභාගී වීම සඳහා අවස්ථා ලබා දීමට කටයුතු කළ යුතු අතර, වෘත්තීය සංවර්ධනය සඳහා නිසි මඟපෙන්වීම් ලබාදීම ද අත්‍යවශ්‍ය වේ. දෙමාපියන් දරුවන්ට උපරිම සහාය ලබාදීම සඳහා ඔවුන් දැනුවත් කර සවිබලගැන්වීමත්, දරුවන් සමඟ යහපත් සමාජ සම්බන්ධතා ගොඩනැන්වීමත්, ආන්තීකරණය හේතුවෙන් පවතින සමාජීය දූර්මත හා අයථා දෘෂ්ටිකෝණ දුරු කිරීමත් අත්‍යවශ්‍ය මැදිහත්කරණ ක්‍රියාමාර්ග වේ. මෙම සියලු ක්‍රියාවලිය දෘශ්‍යාබාධිත දරුවන්ගේ අධ්‍යාපනික ප්‍රගතිය පමණක් නොව, ඔවුන්ගේ සමාජීය සහසම්බන්ධතා හා අනාගත ජීවන තත්ත්වය ද ගොඩනඟා ගැනීමට මූලික වශයෙන් දායක වේ.

**සමාලෝචනය**

දෘශ්‍යාබාධිත සිසුන්ට පවතින පෙනීමේ දුර්වලතාවය හේතුවෙන් අධ්‍යාපන කටයුතු සඳහා විවිධ අභියෝග සහ දුෂ්කරතා පැවතීම ගෝලීය මට්ටමේ ගැටලුවකි. මෙම ගැටලු සම්බන්ධව ලෝකය පුරා විවිධ පර්යේෂණ පවත්වා තිබේ. නමුත් ඒ එක් එක් පර්යේෂණ මගින් ලබාගත් නිගමනයන් එකිනෙකට වෙනස් වේ. එයට හේතුව එම පර්යේෂණ මගින් ලබාදුන් නිගමන එම පර්යේෂණය සිදු කළ ප්‍රදේශයට හෝ රටට පමණක් සීමා වීමය.

මෙම පර්යේෂණයෙන් හෙළි වන්නේ, ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත සිසුන් සඳහා විශේෂිත අධ්‍යාපන වැඩසටහන් තිබුණ ද, ඉගෙනුම් ක්‍රියාවලියේදී තාක්ෂණික පහසුකම්, ගුරු පුහුණු කිරීම් හා සමාජ සහයෝගය අඩු වීමක් පවතින බවයි. පවතින අධ්‍යාපනික ක්‍රම ඔස්සේ මොවුන් අධ්‍යාපනය ලැබුවද නවීන තාක්ෂණය තවමත් භාවිත නොකරයි. එසේම, බ්‍රේල් පද්ධතිය, ශ්‍රව්‍ය උපකරණ, හා අන්තර්ජාල පද්ධති භාවිතා කිරීමේදී ඇති සීමාවන්, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා සමාන අවස්ථා ලබාදීමේ හැකියාව පහළ යැමට හේතු වී ඇත. අධ්‍යාපන ක්‍රමවේද සංවර්ධනය සඳහා යෝජනා මෙන්ම ප්‍රතිපත්ති මට්ටමින් වෙනස්කම් කිරීමටද අවශ්‍ය බව පර්යේෂණය හරහා පෙන්වා දෙනු ලැබේ.

දෘශ්‍යාබාධිත සිසුන්ට සාර්ථක අධ්‍යාපනයක් ලබාදීම සඳහා විශේෂිත ඉගෙනුම් ක්‍රම වලින් යුත් විශේෂිත වූ ආධාරක හා තාක්ෂණික උපකරණ ඉතා වැදගත් වේ. බ්‍රේල් ක්‍රමය, ශ්‍රව්‍ය ආධාරක, තාක්ෂණික උපකරණ, සිසුන්ගේ අධ්‍යාපන හැකියාවන් වැඩිදියුණු කිරීමට උපකාරී වේ. මෙම සිසුන්ට අධ්‍යාපන කටයුතුවලදී ගුරුවරුන්ගේ සහාය අනිවාර්ය වන අතර මෙහිදී ගුරු පුහුණු වැඩසටහන්, උපකාරක ඉගෙනුම් ක්‍රම සහ සමාජ සංවර්ධන ක්‍රමවේද වැදගත් වේ. නව තාක්ෂණය භාවිතය පිළිබඳ දැනුම හා සම්පත් ඌණතා සහ ඉගෙනුම් කටයුතුවලට ප්‍රවේශ වීමේ හැකියාව සීමා වේ. මෙම සිසුන්ගේ අධ්‍යාපනයේ සාර්ථකත්වය වඩාත් ඍජුවම සම්බන්ධව ඇත්තේ යෝග්‍ය සම්පත්, නවීන ඉගෙනුම් ක්‍රමවල සහ ගුරු මඟ පෙන්වීමේ ගුණාත්මකතාවය සමඟය. ඒ අනුව මේ සම්බන්ධයෙන් සමාජ වැඩකරුවකු ලෙස මැදිහත්වීම, බලගැන්වීම, අභිප්‍රේරණය සහ යොමු කිරීම සිදුකිරීම වඩාත් සාධනීය තත්ත්වයක් ලෙස පෙන්වා දිය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

ආබාධ සහිත දරුවන් සඳහා විශේෂ අධ්‍යාපනය. (2005). ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය.
ආබාධිත බව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය. (2003). සමාජ සේවා හා සමාජය සුභසාධන අමාත්‍යාංශය.

උයන්ගොඩ, ජ. (2016). සමාජීය විද්‍යා පර්යේෂණ යෝජනාවලියක් ලිවීම.

එක්සත් ජාතීන්ගේ ජනගහන දත්ත. (2020). ලෝක ජනගහනය හා ආබාධිතතාව.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව. (2016). ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව. අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව.

විගණකාධිපති දෙපාර්තමේන්තුව. (2015). ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ වාර්තාව. ශ්‍රී ලංකා රජය.

සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය. (2003, අගෝස්තු). ආබාධිත බව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය.

සිල්වා, ද කේ. සී. (2003). ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිතයෝ (ප්‍රථම මුද්‍රණය).

හතුරුසිංහ, පී. ලයනල්. (1998). ආබාධ සහිත දරුවන් සඳහා විශේෂ අධ්‍යාපනය. කතෘ ප්‍රකාශන.

හතුරුසිංහ, පී. ලයනල්. (1999). ශ්‍රී ලංකාවේ ආබාධිත දරුවන් සඳහා විශේෂ පාසල්. කතෘ ප්‍රකාශන.

Abedera, A. P., Banagala, C., Gamage, K. M. K., Gilbert, C., Goodlavalletti, M. V. S., Mahipala, P. G., & Schmitt, R. (2018). Sri Lanka National Blindness, Visual Impairment and Disability Survey.

Andrew, O. (2015). The Challenges of Educating the Visually Impaired and Quality Assurance in Tertiary Institutions of Learning in Nigeria. International Journal of Educational Administration and Policy Studies, 7(7), 129-133. Retrieved from https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://files.eric.ed.gov/fulltext/EJ1077784.pdf&ved=2ahUKEwjXmb2k9a3sAhULXSsKHQkeALOQFjAPegQIHRAL&usg=AOvVaw1Z0dnkqjKsVrisda yYVDT7

Chiu, H. Y., & Chan, H. S. (2024). The effect of vocational training on the quality of life of the visually impaired.